ÀNI
ART ACADEMIES

# ආධුනිකත්ව පාඨමාලාව සඳහා අයදුම්පත

ආනි ආර්ට් ඇකඩමීස් යනු ප්‍රබල බහු වාර්ෂික චිත්‍ර කුසලතා අධ්‍යාපනයක් ලොව වටා සිටින නැගී එන චිත්‍ර ශිල්පීන්ට සපයන ලාභ නොලබන ආයතනයකි. චිත්‍ර ශිල්පී ඇන්තනි ජේ. වයිවුලිස් විසින් සංවර්ධිත බෙහෙවින් සාර්ථක පුහුණු පද්ධතියක් උපයෝගී කරගන්නා ආනි ආර්ට් ඇකඩමීස් පාඨමාලාව සැලසුම්කර ඇත්තේ තර්කනය හා විනය ඔස්සේ නිර්මාණශීලී නිදහස ප්‍රවර්ධනය කිරීමටයි.
චිත්‍රාගාර විෂය මාලාව කොටස් 7 කට බෙදී ඇත: ඇඳීම හැඳින්වීම, ද්‍රව්‍ය පාලනය කිරීම, ආකෘතියේ කායච්ඡේදය, ස්වාභාවික ආකෘති, චිත්‍ර ශිල්පය පිළිබඳ හැඳින්වීම, චිත්‍ර ශිල්පීය ක්‍රම, සහ අවසානය.
සාමාන්‍යයෙන් ආධුනිකත්ව පාඨමාලාව අවුරුදු තුන - හතරකින් සිසුන්ට සම්පූර්ණ කළ හැකිය. කෙසේ වුවද ආනි ආර්ට් ඇකඩමීස් හි පුද්ගලික සැකසුම සිසුන්ගේ තනි ඉලක්ක ගලපා සකස් කිරීම ඉඩ සලසයි. අවධානය යොමු කරන ඇතැම් කොටස් සඳහා වැඩි කාලයක් ගත විය හැකි බැවින් (සුපරීක්ෂාකාරී විදැහුම්කරණ වින්‍යාසය  ආදිය) පාඨමාලා කාලය  දීර්ඝ විය හැකිය. අනාගත සිසුන් සතියකට අවම වශයෙන් පැය 40 ක් පූර්ණ කාලීනව සහභාගී වීමට කැමති විය යුතු අතර පුහුණුව අවසන් කිරීමට අතිශයින්ම කැපවිය යුතුයි.
ආනි ආර්ට් ඇකඩමීස් පවත්වාගෙන යන උපදේශකයෙකුට ශිෂ්‍ය අනුපාතය (1:25 උපරිම.) ඉතා කුඩායි. පෞද්ගලික අවධානයට විශාල වශයෙන් එය ඉඩ සලසන බැවින් අපි මේ ආකෘතිය අගය කරනවා. සෑම පාසැලකම නිශ්චිතව මෙහෙයුම් පැය ගණන දැන ගැනීම සඳහා ආනි ආර්ට් ඇකඩමීස් වෙබ් අඩවියට කරුණාකර පිවිසෙන්න.

<u>සම්පූර්ණ ශිෂ්‍යත්ව අවස්ථාවන් ආනි ආර්ට් ඇකඩමීස් ඔස්සේ සෘජුව ලබා ගත හැකිය</u>.

ප්‍රධාන උපදේශක ඇන්තනි ජේ.  වයිවුලිස්ගේ වෘත්තීයමය සාරාංශය ඇතුළුව, මෙම පුහුණු වැඩසටහනේ මූලාරම්භය ගැන වැඩි විස්තර සඳහා, පිවිසෙන්න www.aniartacademies.org

---

වෙනස්කම් නොකිරීමේ ප්‍රතිපත්තිය: ආනි චිත්‍ර කලායතනය (පාසල) වර්ගය, වර්ණය, ජාතික සහ ජනවාර්ගික සම්භවය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික යොමුව, ලිංගික අභිප්‍රාය, සංස්කෘතිය සහ ආගම හෝ කිසියම් ආබාධ සහිත, යන කරුනු මත වෙනස් කිරීමකින් තොරව සාමාන්‍යයෙන් පාසලේ සිසුන්ට ලබා දී හෝ ලබාදීමට ඇති සමස්ත අයිතිවාසිකම්, වරප්‍රසාද, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා සිසුන් අතුළත් කරගනී ජාතිය. වර්ණය, ජාතික, හෝ වාර්ගික සම්භවය, ස්ත්‍රී පුරුෂභාවය, ලිංගික යොමුව, ලිංගික අභිප්‍රායන්, සංස්කෘතිය, ආගම සහ ආබාධිතභාවය ආදියේ පදනම මත පාසැලේ අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රවේශ ප්‍රතිපත්ති, ශිෂ්‍යත්ව, ණය සහ අනෙකුත් මූල්‍ය ආධාර වැඩසටහන් සහ කලා කටයුතු හා පාසල මගින් පරිපාලනය කරන වෙනත් වැඩසටහන් කළමනාකරනය කිරීමේදී වෙනස්කම් සිදු නොවේ.

# ඉල්ලුම් කළ යුතු ආකාරය

අපගේ ප්‍රධාන වෙබ් අඩවියේ aniartacademies.org/enrollment/  පහසුකම හරහා හෝ මෙහි උපදෙස් අනුව මෙම අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් අයදුම්පත් යොමු කළ හැකිය. කරුණාකර මෙම සම්පූර්ණ කරන ලද අයදුම්පත, කලා කෘති 5-10 ක්, සහ රචනාවක් ඔබ අයදුම් කරනු ලබන පාසල සඳහා www.aniartacademies.org වෙබ් අඩවියේ  ලැයිස්තුගත කර ඇති පහත ලිපිනය වෙත නැවත ලබා දෙන්න.

උදාහරණයක්:
ÀNI Art Academies Sri Lanka
Apprenticeship Application
Nelumwewa, Rathmale,
Dikwella.
MH 81200

සියලුම අයදුම්කරුවන් සතුව උසස් පාසලේ ඩිප්ලෝමාවක් හෝ සමාන සුදුසුකමක් තිබිය යුතුය. ඔබ අයදුම් කරන පාසල සඳහා ප්‍රාදේශීය සුදුසුකම් පරීක්ෂා කිරීමට වග බලා ගන්න. සෑම පාසලකම විස්තරය, සුදුසුකම් සපුරා ගැනීම මෙහි දක්නට ලැබේ:
aniartacademies.org/enrollment/
වසරකට 4 වතාවක් (ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර්) අයදුම්පත් සමාලෝචනය කෙරේ. එක් එක් අයදුම්කරු අයදුම්පත් සමාලෝචනය කරන අවස්ථාවේදී මූලික දුරකථන සම්මුඛ සාකච්ඡාවකට සහ චිත්‍රාගාරය නැරඹීමට විද්‍යුත් තැපෑල හරහා සම්බන්ධ කර ගැනේ. චිත්‍ර නිර්මාණයන්ගේ මුල් පිටපත් ඔබේ අයදුම්පත සමඟ යවන්න එපා. කිසිදු අයදුම්පත් ද්‍රව්‍යයක් ආපසු නොඑවන බව කරුණාකර සටහන් කරගන්න.

අයදුම්පතෙහි චිත්‍ර ගොනුව කොටසෙහි ලැයිස්තුගත කර ඇති පිරිවිතර කරුණාකර සමාලෝචනය කරන්න.

## ආධුනිකත්ව පාඨමාලාව සඳහා අයදුම්පත පිටුව 2

ඔබ අයදුම් කරන පාසල:________________________ අරමුණුකරගත් ආරම්භක දිනය:________________________

## සම්බන්ධ කරගැනීමේ / සාමාන්‍ය තොරතුරු

නම:________________________

ලිපිනය:________________________

නගරය:________________ පලාත:________________ තැපැල් සංකේතය:________________

රට:________________________

දුරකතනය:________________ විද්යුත් ලිපිනය:________________

වෙබ් ලිපිනය:________________________

අවසාන වරට සමත් පංතියට:________________ පාසලේ නම:________________

## ද්විතීයික/ පශ්වාත් ද්විතීයික/ චිත්‍ර පිළිබඳ කලින් පුහුණුව (අදාළ වේ නම්)

පාසලේ නම:________________________

ලිපිනය:________________________

ඇතුළත් වූ / පිටත්ව ගිය දිනය:________________ උපාධිය: ________________

පාසලේ නම:________________________

ලිපිනය:________________________

ඇතුළත් වූ / පිටත්ව ගිය දිනය:________________ උපාධිය: ________________

** කරුණාකර මෙම තොරතුරු සඳහා අවශ්‍ය නම් අතිරේක කඩදාසි අමුණන්න

## පුද්ගලික නිර්දේශ (ඔබට තුනක් දක්වා නිර්දේශ ලිපි ඇතුළත් කළ හැකිය).

අවම වශයෙන් පෞද්ගලික නිර්දේශ කිරීම් දෙකක වත් නම් සහ සම්බන්ධතා තොරතුරු කරුණාකර ඇතුළත් කරන්න. අවම වශයෙන් එක් නිර්දේශ කරුවෙක් ඔබේ චිත්‍ර කලා කෘති හුරු පුරුදු පුද්ගලයකු විය යුතුය.

නම/සම්බන්ධතාවය:________________________

ලිපිනය:________________________

දුරකතනය /විද්යුත් ලිපිනය:________________________

නම/සම්බන්ධතාවය:________________________

ලිපිනය:________________________

දුරකතනය /විද්යුත් ලිපිනය:________________________

## වත්මන් කාර්යයන්/ක්‍රියාකාරකම් ලේඛනය

ඔබගේ දැනට වගකීම් සහ කැපවීම් මනසේ තබාගෙන මෙම සම්පූර්ණ පුහුණු වැඩසටහන සම්පූර්ණ කිරීම කෙසේ විය හැකිද:

විය නොහැකිය 1○ 2○ 3○ 4○ 5○ අනිවාර්යයෙන්ම විය හැකිය.

කරුණාකර වත්මන් කැපවීම් පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න (රැකියා, පාසැල්, ප්‍රජා ක්‍රීඩා සහ සමාජ ශාලා)

ඉරිදා:________________________

සඳුදා:________________________

අඟහරුවාදා:________________________

බදාදා:________________________

බ්‍රහස්පතින්දා:________________________

සිකුරාදා:________________________

සෙනසුරාදා:________________________

# ආධුනිකත්ව පාඨමාලාව සඳහා අයදුම්පත පිටුව 3

## චිත්‍ර ගොනුව

කරුණාකර ඔබ අතීතයේ වැඩ කර ඇති නිර්මාණාත්මක ව්‍යාපෘති වල ඡායාරූප 3 ක් හෝ ඊට වඩා වැඩියෙන් ඇතුළත් කරන්න. මේවා ඡායාරූප, ඩිජිටල් මාධ්‍ය මත රූප ස්වරූපයෙන් විය හැකිය (සංයුක්ත තැටි, ඩී වී ඩී තැටි, මෙමොරි ස්ටික්, ෆ්ලෑශ් ඩ්‍රයිව් ****). කරුණාකර ඩිජිටල් රූප එකක් 300dpi හෝ 10MB නොඉක්මවන බව තහවුරු කරන්න.

**** අයදුම්පත සමග ඉදිරිපත් කළ මාධ්‍යයන් ආපසු ලබා නොදෙනු ඇත.
ආනි ආර්ට් ඇකඩමීස් කිසිදු නිර්මාණයක මුල් පිටපත් අයදුම්පත්‍රය සමග පිළිගන්නේ නැතිබව කරුණාකර සලකන්න. ඉදිරිපත් කළ ද්‍රව්‍යයන්ට වන කිසිදු හානියක් හෝ අලාභයක් සඳහා ආනි ආර්ට් ඇකඩමීස් වගකිව යුතු වන්නේ නැත.

## රචනාව

කරුණාකර කෙටි රචනාවක් පහත කරුනු විස්තර කරමින් ඇතුළත් කරන්න

- පෞද්ගලික සහ වෘත්තීය යන ධාරිතා දෙකේම චිත්‍ර ශිල්පීමය සංවර්ධනය සඳහා ඔබගේ ඉලක්ක.
- ඔබේ ජීවිත කාලය පුරාම චිත්‍ර කලාව හෝ නිර්මාණ ක්‍රියාවලිය ඔබ කෙරෙහි ඇති කළ බලපෑම.
- ඔබේ ජීවිත කාලය පුරාම ඔබ දුෂ්කර අභියෝගවලට ළඟා වූ සහ ජයගත් ආකාරය.
- ඔබ බෙදාහදා ගන්න ආඩම්බර වන ඕනෑම ජයග්‍රහණයක්.
- වර්තමානයේ නිර්මාණාත්මක ප්‍රයත්නයන්හිදී ඔබ සතියකට කොපමණ පැය ගණනක් ආයෝජනය කරන්නේද?
- ආනි ආර්ට් ඇකඩමීස් වැඩසටහන ඔබගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඔබට උපකාර වනු ඇති ඔබ විශ්වාස කරන්නේ කෙසේද?

---

පහත අත්සන් කිරීමෙන් ඉහත සඳහන් ආනි ආර්ට් ඇකඩමීස් හි නියමයන් හා කොන්දේසි වලට මම එකඟ වෙමි. ආනි ආර්ට් ඇකඩමීස්, එහි සේවකයින් හා ස්වේච්ඡා සේවකයන් හා ආනි ආර්ට් ඇකඩමීස් සම්බන්ධ වෙනත් පුද්ගලයන්, මගේ ලියාපදිංචිය හෝ සහභාගිත්වය හෝ එහි උපකරණ හෝ පහසුකම් භාවිතා කිරීම නිසා මට අඛණ්ඩව සිදු විය හැකි ඕනෑම හානියක් සම්බන්ධ සියලු වගකීම් වලින් මට හානියක් කර නැතැයි මම එකඟ වෙමි.

මාගේ අයදුම්පතෙහි සියලු තොරතුරු, මගේ රචනය සහ චිත්‍ර ගොනුව ඇතුළුව, මගේම වැඩ බවත්, සැබවින්ම සත්‍යයව හා අවංකව නිරූපණය කරන බවත් මම සහතික කරමි.

අත්සන______________________________ දිනය ______________________________

සම්පූර්ණ කරන ලද අයදුම්පත, චිත්‍ර ගොනුව සහ රචනාව වෙබ් අඩවියේ ලැයිස්තුගත කර ඇති පරිදි අදාල ලිපිනය වෙත තැපැල් කරන්න:
aniartacademies.org/enrollment/

මෙම අයදුම්පත සම්බන්ධයෙන් ප්‍රශ්න හෝ අදහස් දැක්වීම් info@aniartacademies.org ආනි ආර්ට් ඇකඩමීස් විද්‍යුත් ලිපිනයට යොමු කළ හැකිය.